(නවවැනි පාර්ලිමේන්තුව - සිව්වැනි සභාවාරය)

අංක **62.**]

පාර්ලිමේන්තුවේ කාර්ය සටහන්

2023 ඔක්තෝබර් 04 බදාදා පූ.භා. 9.30 ට

පැමිණි මන්ත්‍රීන් :

ගරු **අජිත් රාජපක්ෂ මහතා,** නියෝජ්‍ය කථානායකතුමා සහ කාරක සභා සභාපතිතුමා

ගරු **අංගජන් රාමනාදන් මහතා,** නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමා

ගරු **දිනේෂ් ගුණවර්ධන මහතා,** අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා

ගරු **මහින්ද අමරවීර මහතා,** කෘෂිකර්ම අමාත්‍යතුමා

ගරු **(ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා,** ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමා සහ ජනමාධ්‍ය අමාත්‍යතුමා

ගරු **ජීවන් තොන්ඩමන් මහතා,** ජල සම්පාදන සහ වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යතුමා

ගරු **නීතිඥ නිමල් සිරිපාල ද සිල්වා මහතා,** වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා,** වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා සහ කර්මාන්ත අමාත්‍යතුමා

ගරු **නලින් ප්‍රනාන්දු මහතා,** වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යතුමා

ගරු **හරීන් ප්‍රනාන්දු මහතා,** සංචාරක හා ඉඩම් අමාත්‍යතුමා

ගරු **නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා,** අධ්‍යාපන අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා

ගරු **කෙහෙලිය රඹුක්වැල්ල මහතා,** සෞඛ්‍ය අමාත්‍යතුමා

ගරු **නීතිඥ පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය,** වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යතුමිය

ගරු **විදුර වික්‍රමනායක මහතා,** බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා

ගරු **කංචන විජේසේකර මහතා,** විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමා

ගරු **ජනාධිපති නීතිඥ එම්. යූ. එම්. අලි සබ්රි මහතා,** විදේශ කටයුතු අමාත්‍යතුමා

ගරු **සජිත් ප්‍රේමදාස මහතා,** පාර්ලිමේන්තුවේ විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා

ගරු **(වෛද්‍ය) සීතා අරඹේපොල මහත්මිය,** සෞඛ්‍ය රාජ්‍ය අමාත්‍යතුමිය

ගරු **ලසන්ත අලගියවන්න මහතා,** ප්‍රවාහන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **අ. අරවින්ද් කුමාර් මහතා,** අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඩයනා ගමගේ මහත්මිය,** සංචාරක රාජ්‍ය අමාත්‍යතුමිය

ගරු **සිරිපාල ගමලත් මහතා,** මහාමාර්ග රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **සිවනේසතුරෙයි චන්ද්‍රකාන්තන් මහතා,** ග්‍රාමීය මාර්ග සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **අනුරාධ ජයරත්න මහතා,** අධිකරණ හා බන්ධනාගාර කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **චාමර සම්පත් දසනායක මහතා,** ප්‍රාථමික කර්මාන්ත රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **නීතිඥ මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මහතා,** කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **සනත් නිශාන්ත මහතා,** ජල සම්පාදන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **අශෝක ප්‍රියන්ත මහතා,** ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ශාන්ත බණ්ඩාර මහතා,** ජනමාධ්‍ය රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **තාරක බාලසූරිය මහතා,** විදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **විජිත බේරුගොඩ මහතා,** පිරිවෙන් අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **කේ. කාදර් මස්තාන් මහතා,** ග්‍රාමීය ආර්ථික රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ප්‍රසන්න රණවීර මහතා,** කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **(ආචාර්ය) සුරේන් රාඝවන් මහතා,** උසස් අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ශෂීන්ද්‍ර රාජපක්ෂ මහතා,** වාරිමාර්ග රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ජානක වක්කුඹුර මහතා,** පළාත් සභා හා පළාත් පාලන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **තේනුක විදානගමගේ මහතා,** නාගරික සංවර්ධන හා නිවාස රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **එස්. වියාලේන්ද්‍රන් මහතා,** වෙළඳ රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **රංජිත් සියඹලාපිටිය මහතා,** මුදල් රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ශෙහාන් සේමසිංහ මහතා,** මුදල් රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඩී. බී. හේරත් මහතා,** පශු සම්පත් සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **නීතිඥ තලතා අතුකෝරල මහත්මිය**

ගරු **සම්පත් අතුකෝරල මහතා**

ගරු **රෝහිත අබේගුණවර්ධන මහතා**

ගරු **වජිර අබේවර්ධන මහතා**

ගරු **අශෝක් අබේසිංහ මහතා**

ගරු **(ආචාර්ය) හරිනි අමරසූරිය මහත්මිය**

ගරු **තුෂාර ඉඳුනිල් අමරසේන මහතා**

ගරු මායාදුන්න චින්තක අමල් මහතා

ගරු තවරාජා කලෙයි අරසන් මහතා

ගරු ජේ. සී. අලවතුවල මහතා

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා

ගරු තිසකුට්ටි ආරච්චි මහතා

ගරු යූ. කේ. සුමිත් උඩුකුඹුර මහතා

ගරු (ආචාර්ය) මේජර් ප්‍රදීප් උඳුගොඩ මහතා

ගරු සංජීව එදිරිමාන්න මහතා

ගරු අකිල එල්ලාවල මහතා

ගරු ලලිත් එල්ලාවල මහතා

ගරු ගයන්ත කරුණාතිලක මහතා

ගරු නීතිඥ සාගර කාරියවසම් මහතා

ගරු ෆයිසාල් කාසිම් මහතා

ගරු ජයන්ත කැටගොඩ මහතා

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා

ගරු උදයන කිරිඳිගොඩ මහතා

ගරු ලලිත් වර්ණ කුමාර මහතා

ගරු කේ. පී. එස්. කුමාරසිරි මහතා

ගරු කරුණාදාස කොඩිතුවක්කු මහතා

ගරු නාලක බණ්ඩාර කෝට්ටේගොඩ මහතා

ගරු උදය ගම්මන්පිල මහතා

ගරු (වෛද්‍ය) උපුල් ගලප්පත්ති මහතා

ගරු උදයකාන්ත ගුණතිලක මහතා

ගරු කෝකිලා ගුණවර්ධන මහත්මිය

ගරු යදාමිණී ගුණවර්ධන මහතා

ගරු එස්. එම්. චන්ද්‍රසේන මහතා

ගරු මිලාන් ජයතිලක මහතා

ගරු පියංකර ජයරත්න මහතා

ගරු එම්. එස්. තවුෆික් මහතා

ගරු කුලසිංහම් තිලීපන් මහතා

ගරු ජනක බණ්ඩාර තෙන්නකෝන් මහතා

ගරු ෂාන් විජයලාල් ද සිල්වා මහතා

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා

ගරු අනුර දිසානායක මහතා

ගරු දුමින්ද දිසානායක මහතා

ගරු මංජුලා දිසානායක මහත්මිය

ගරු මයන්ත දිසානායක මහතා

ගරු විමලවීර දිසානායක මහතා

ගරු සාරතී දුෂ්මන්ත මහතා

ගරු (මේජර්) සුදර්ශන දෙනිපිටිය මහතා

ගරු ඉසුරු දොඩන්ගොඩ මහතා

ගරු නීතිඥ ප්‍රේම්නාත් සී. දොලවත්ත මහතා

ගරු ඩබ්ලිව්. එච්. එම්. ධර්මසේන මහතා

ගරු එච්. නන්දසේන මහතා

ගරු අසංක නවරත්න මහතා

ගරු වාසුදේව නානායක්කාර මහතා

ගරු චාල්ස් නිර්මලනාදන් මහතා

ගරු බුද්ධික පතිරණ මහතා

ගරු නිමල් පියතිස්ස මහතා

ගරු (මහාචාර්ය) ජී. එල්. පීරිස් මහතා

ගරු ඩිලාන් පෙරේරා මහතා

ගරු නිරෝෂන් පෙරේරා මහතා

ගරු කේ. සුජිත් සංජය පෙරේරා මහතා

ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා

ගරු මුදිතා ප්‍රිශාන්ති මහත්මිය

ගරු උද්දික ප්‍රේමරත්න මහතා

ගරු රෝහණ බංඩාර මහතා

ගරු ආර්. එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා

ගරු (මහාචාර්ය) රංජිත් බණ්ඩාර මහතා

ගරු රිසාඩ් බදියුදීන් මහතා

ගරු එස්. එම්. මරික්කාර් මහතා

ගරු ඉම්රාන් මහරූෆ් මහතා

ගරු ඉම්තියාස් බාකීර් මාකාර් මහතා

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා

ගරු නීතිඥ එස්. එම්. එම්. මුෂාරෆ් මහතා

ගරු නීතිඥ අනුර ප්‍රියදර්ශන යාපා මහතා

ගරු නිශාන්ත වසන්ත යාපාබණ්ඩාර මහතා

ගරු පාඨලී චම්පික රණවක මහතා

ගරු බී. වයි. ජී. රත්නසේකර මහතා

ගරු කුමාරසිරි රත්නායක මහතා

ගරු සී. බී. රත්නායක මහතා

ගරු අලි සබ්රි රහීම් මහතා

ගරු ඉෂාක් රහුමාන් මහතා

ගරු හර්ෂණ රාජකරුණා මහතා

ගරු ගුණතිලක රාජපක්ෂ මහතා

ගරු මහින්ද රාජපක්ෂ මහතා

ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ මහතා

ගරු (ආචාර්ය) වී. රාධක්‍රිෂ්ණන් මහතා

ගරු එම්. රාමේෂ්වරන් මහතා

ගරු නිමල් ලාන්සා මහතා

ගරු ගාමිණී ලොකුගේ මහතා

ගරු ගාමිණී වලේබොඩ මහතා

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා

ගරු රාජිකා වික්‍රමසිංහ මහත්මිය

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය

ගරු චමින්ද විජේසිරි මහතා

ගරු එම්. ඩබ්ලිව්. ඩී. සහන් ප්‍රදීප් විතාන මහතා

ගරු නිශාන්ත මධුර විතානගේ මහතා

ගරු හේෂා විතානගේ මහතා

ගරු ඩී. වීරසිංහ මහතා

ගරු වීරසුමන වීරසිංහ මහතා

ගරු (ආචාර්ය) සරත් වීරසේකර මහතා

ගරු දිලිප් වෙදආරච්චි මහතා

ගරු කුමාර වෙල්ගම මහතා

ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා

ගරු ජගත් සමරවික්‍රම මහතා

ගරු ජයන්ත සමරවීර මහතා

ගරු මෛත්‍රීපාල සිරිසේන මහතා

ගරු එම්. ඒ. සුමන්තිරන් මහතා

ගරු ජගත් කුමාර සුමිත්‍රාආරච්චි මහතා

ගරු වඩිවේල් සුරේෂ් මහතා

ගරු නීතිඥ ඩබ්ලිව්. ඩී. ජේ. සෙනෙවිරත්න මහතා

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා

ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා

ගරු එච්. එම්. එම්. හරීස් මහතා

ගරු අබ්දුල් හලීම් මහතා

ගරු (මහාචාර්ය) චරිත හේරත් මහතා

ගරු විජිත හේරත් මහතා

ගරු ජයරත්න හේරත් මහතා

ගරු සමන්ප්‍රිය හේරත් මහතා

ගරු මර්ජාන් ෆලීල් මහතා

ගරු ඒ. එච්. එම්. ෆවුසි මහතා

චමින්ද කුලරත්න මහතා, වැඩ බලන පාර්ලිමේන්තුවේ මහ ලේකම්

හංස අබේරත්න මහතා, සහකාර මහ ලේකම්

කල් තැබීම අනුව පාර්ලිමේන්තුව රැස්විය. නියෝජ්‍ය කථානායකවරයා මූලාසනාරූඪ විය.

1. **කථානායකවරයා විසින් කරනු ලබන නිවේදන:** නියෝජ්‍ය කථානායකවරයා විසින් මතු පළවන නිවේදනය කරන ලදී:—

"ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 121(1) ව්‍යවස්ථාව ප්‍රකාරව, **'මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ'** නමැති පනත් කෙටුම්පත සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ඉදිරිපත් කරන ලද පෙත්සම් දෙකක පිටපත් ගරු කථානායකතුමා වෙත ලැබී ඇති බව පාර්ලිමේන්තුවට දැනුම්දීමට කැමැත්තෙමි."

2. **ලිපිලේඛනාදිය පිළිගැන්වීම**: (1) නියෝජ්‍ය කථානායකවරයා විසින් 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 34 වගන්තිය ප්‍රකාරව, ජාතික විගණන කාර්යාලය විසින් සකස් කරන ලදුව, මුදල් විෂයභාර අමාත්‍යවරයාගේ නිරීක්ෂණ ද සමඟ ඉදිරිපත් කරන ලද ජාතික විගණන කාර්යාලයේ 2024 වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුව ඉදිරිපත් කරන ලදී.

"එකී අයවැය ඇස්තමේන්තුව රජයේ මුදල් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු ය" පාර්ලිමේන්තුවේ සභානායකවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(2) නියෝජ්‍ය කථානායකවරයා විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව 2022 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ පළමුවැනි කාණ්ඩයේ XV, XVI, XVII, XVIII, XIX හා XX කොටස්, සිව්වැනි කාණ්ඩයේ III, IV, V හා VI කොටස්, පස්වැනි කාණ්ඩයේ IV හා V කොටස් සහ හයවැනි කාණ්ඩයේ III, IV හා V කොටස් ඉදිරිපත් කරන ලදී.

එම වාර්තාව, **සභා මේසය** මත තැබිය යුතු යැයි ද මුද්‍රණය කළ යුතු යැයි ද නියෝග කරන ලදී.

(3) නියෝජ්‍ය කථානායකවරයා විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව විගණකාධිපතිවරයාගේ වාර්තාවේ දසවැනි කාණ්ඩයේ අනීතිකව ආනයනය කරන ලද හෝ එකලස් කරන ලද වාහනවල වැසි අංක හා එන්ජින් අංක දත්ත මෝටර් රථ ලියාපදිංචි කිරීමේ දත්ත පද්ධතියට වංචනිකව ඇතුළත් කර මෝටර් රථ ලියාපදිංචි කිරීමේ ව්‍යාජ සහතික නිකුත් කිරීම පිළිබඳ 2022 විශේෂ විගණන වාර්තාවේ - III කොටස ඉදිරිපත් කරන ලදී.

එම වාර්තාව, **සභා මේසය** මත තැබිය යුතු යැයි ද මුද්‍රණය කළ යුතු යැයි ද නියෝග කරන ලදී.

3. කාරක සභා වාර්තා පිළිගැන්වීම: රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ සභාපති ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා වෙනුවෙන් එම කාරක සභාවේ සාමාජික ගරු නීතිඥ මධුර විතානගේ මහතා විසින් එම කාරක සභාව වෙත යොමු කරන ලද 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමයන් සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කරන ලදී.

එම වාර්තාව, **සභා මේසය** මත තැබිය යුතු යැයි නියෝග කරන ලදී.

4. මහජන පෙත්සම් පිළිගැන්වීම:

මහරගම, දඹහේන පාර, අංක 10/ඒ දරන ස්ථානයෙහි පදිංචි ඩබ්.රාජ් මෙන්ඩිස් අබේසේකර මහතාගෙන් ලැබුණු 2023.06.16 දිනැති පෙත්සම ගරු පියංකර ජයරත්න මහතා විසින් පිළිගන්වන ලදී.

30(10) දරන පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගය යටතේ පෙත්සම, මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට යොමු කරනු ලැබේ.

5. ශ්‍රී ලංකා ජාතික අක්ෂි බැංකු භාර පනත් කෙටුම්පත:— දෙවැනිවර කියවීමේ නියෝගය කියවන ලදී.

“පනත් කෙටුම්පත දැන් දෙවැනි වර කියවිය යුතු ය”යි සෞඛ්‍ය අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

(අ.භා. 12.35ට නියෝජ්‍ය කාරක සභා සභාපතිවරයා මූලාසනාරූඪ විය.)

“ගරු නීතිඥ එස්. එම්. එම්. මුෂාරෆ් මහතා මූලාසනාරූඪ විය යුතු ය”යි වැවිලි කර්මාන්ත අමාත්‍ය සහ කර්මාන්ත අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ.භා. 2.12ට ගරු නීතිඥ එස්. එම්. එම්. මුෂාරෆ් මහතා මූලාසනාරූඪ විය.)

“ගරු නීතිඥ මධුර විතානගේ මහතා මූලාසනාරූඪ විය යුතු ය”යි විදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ.භා. 3.38ට ගරු නීතිඥ මධුර විතානගේ මහතා මූලාසනාරූඪ විය.)

(අ.භා. 4.46ට නියෝජ්‍ය කථානායකවරයා මූලාසනාරූඪ විය.)

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙවැනි වර කියවන ලදී.

“පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතු ය”යි සෞඛ්‍ය අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

තදනන්තරව පාර්ලිමේන්තුව සම්මුති මාර්ගයෙන් කාරක සභාවකට පරිවර්තනය විය.

(කාරක සභාවේදී)

නියෝජ්‍ය කථානායකවරයා මූලාසනාරූඪ විය.

1 වැනි සහ 2 වැනි වගන්ති සභා සම්මත විය.

3 වැනි වගන්තිය

සෞඛ්‍ය අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා ඉදිරිපත් කළ සංශෝධනයක්: 2 වැනි පිටුවේ 31 වැනි පේළිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"ගාස්තුවක් ඔවුන්ගෙන් අයකර ගැනීම:

එසේ වුව ද, මෙම ඡේදය ප්‍රකාරව කුණීත පටක හා වෙනත් පටක ලබා දීමේදී, සෑම අවස්ථාවක දී ම, රජයේ රෝහල් විසින් සහ ශ්‍රී ලාංකික පුරවැසියන් විසින් කළ ඉල්ලීම්වලට ප්‍රමුඛත්වය ලබා දිය යුතු ය.";

"සංශෝධනය පිළිගත යුතු ය" යි යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

"වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය" යි යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

4 වැනි වගන්තිය

සෞඛ්‍ය අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා ඉදිරිපත් කළ සංශෝධනයක්: 3 වැනි පිටුවේ 9 වැනි පේළියේ සිට 12 වැනි පේළිය දක්වා පේළි (ඒ පේළි දෙක ද ඇතුළත්ව) ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"(i) (මෙහි මින්මතු "සභාපතිවරයා" යනුවෙන් සඳහන් කරනු ලබන) මණ්ඩලයේ සභාපතිවරයා ලෙස කටයුතු කරනු ලැබිය යුතු සෞඛ්‍යය විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා;

(ii) සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ - ජනරාල්වරයා;";

"සංශෝධනය පිළිගත යුතු ය" යි යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

"වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය" යි යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

5 වැනි වගන්තියේ සිට 7 වැනි වගන්තිය දක්වා සභා සම්මත විය.

8 වැනි වගන්තිය

සෞඛ්‍ය අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා ඉදිරිපත් කළ සංශෝධනයක්: 6 වැනි පිටුවේ 9 වැනි පේළියේ සිට 11 පේළිය දක්වා පේළි (ඒ පේළි දෙක ද ඇතුළත්ව) ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

" සභාපතිවරයා නොපැමිණි අවස්ථාවක දී, සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් එම රැස්වීමේ මුලසුන දැරිය යුතු ය.";

“සංශෝධනය පිළිගත යුතු ය” යි යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

“වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය” යි යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

9 වැනි සහ 10 වැනි වගන්ති සභා සම්මත විය.

11 වැනි වගන්තිය

සෞඛ්‍ය අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා ඉදිරිපත් කළ සංශෝධනයක්: 8 වැනි පිටුවේ 20 වැනි පේළිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

“ සෞඛ්‍ය අමාත්‍යාංශය විමසා මණ්ඩලය විසින් සකස් කරන ලද බඳවා”;

“සංශෝධනය පිළිගත යුතු ය” යි යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

සෞඛ්‍ය අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 9 වැනි පිටුවේ 23 වැනි පේළිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

“ නිශ්චල ප්‍රදාන, ත්‍යාග, පරිත්‍යාග සහ රික්තවරණ”;

“සංශෝධනය පිළිගත යුතු ය” යි යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

සෞඛ්‍ය අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 10 වැනි පිටුවේ 2 වැනි පේළිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

“ කිරීම සඳහා අවශ්‍ය වන්නා වූ මෙම පනත මඟින් බලය පවරනු ලබන්නා වූ වෙනත් ක්‍රියා සහ දේවල්”;

“සංශෝධනය පිළිගත යුතු ය” යි යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

“වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය” යි යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

12 වැනි වගන්තියේ සිට 17 වැනි වගන්තිය දක්වා සභා සම්මත විය.

18 වැනි වගන්තිය

සෞඛ්‍ය අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා ඉදිරිපත් කළ සංශෝධනයක්: 12 වැනි පිටුවේ 25 වැනි පේළිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

“ ලැයිස්තුවක් ද සමඟ අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කළ යුතු ය. විගණකාධිපතිගේ වාර්තාව ද සමඟ වර්ෂය සඳහා භාරයේ විගණනය කරන ලද ගිණුම් එකී වාර්තාවට අමුණනු ලැබිය යුතු ය.”;

“සංශෝධනය පිළිගත යුතු ය” යි යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

සෞඛ්‍ය අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 12 වැනි පිටුවේ 28 වැනි පේළිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

“ සමඟ එය සලකා බැලීම සඳහා පාර්ලිමේන්තුවේ සභා ගත කළ යුතු ය.”;

“සංශෝධනය පිළිගත යුතු ය” යි යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

“වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය” යි යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

19 වැනි වගන්තියේ සිට 26 වැනි වගන්තිය දක්වා සභා සම්මත විය.

27 වැනි වගන්තිය

සෞඛ්‍ය අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා ඉදිරිපත් කළ සංශෝධනයක්: 17 වැනි පිටුවේ 10 වැනි පේළිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

“ නොවන තැනැත්තන්ගෙන් අය කළ යුතු ගාස්තු;”.;

“සංශෝධනය පිළිගත යුතු ය” යි යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

සෞඛ්‍ය අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 17 වැනි පිටුවේ 13 වැනි පේළිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

“ අනුගමනය කළ යුතු ක්‍රියා පටිපාටිය; සහ

(ඊ) කුණීත පටක හා වෙනත් පටක සඳහා විද්‍යුත් ක්‍රමයෙන් ඉල්ලීම් කිරීම හා සම්බන්ධ කාරණා.”;

“සංශෝධනය පිළිගත යුතු ය” යි යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

“වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය” යි යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

28 වැනි සහ 29 වැනි වගන්ති සභා සම්මත විය.

30 වැනි වගන්තිය

සෞඛ්‍ය අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා ඉදිරිපත් කළ සංශෝධනයක්: 19 වැනි පිටුවේ 10 වැනි පේළිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

“මත බඳවාගනු ලැබිය යුතු ය.

(4) මේ පනත ආරම්භ වන දින හෝ එදිනට පසුව, එහෙත්, කුණීත පටක හා වෙනත් පටක සඳහා විද්‍යුත් ක්‍රමයෙන් ඉල්ලීම් කිරීම සම්බන්ධයෙන් මෙම පනත යටතේ සාදනු ලබන යම් නියෝගයක් බලාත්මක වන දිනට පෙරාතුව ඉදිරිපත් කරන්නා වූ, කුණීත පටක හා වෙනත් පටක සඳහා වූ යම් ඉල්ලීමක්, මේ පනතේ කාර්ය සඳහා මේ පනත යටතේ වලංගු ලෙස ඉදිරිපත් කර ඇති ලෙසටත්, ඒ අනුව ක්‍රියා කරනු ලැබිය හැකි ලෙසටත් සලකනු ලැබිය යුතු ය. ”.

“සංශෝධනය පිළිගත යුතු ය” යි යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

“වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය” යි යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

ප්‍රඥප්ති වගන්තිය සහ නාමය

“ප්‍රඥප්ති වගන්තිය සහ නාමය පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය” යි යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

පනත් කෙටුම්පත සංශෝධන සහිතව වාර්තා කරන ලදී.

"පනත් කෙටුම්පත දැන් සංශෝධිතාකාරයෙන් තුන්වැනි වර කියවිය යුතු ය"යි සෞඛ්‍ය අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත ඊට අනුකූලව, සංශෝධිතාකරයෙන් තුන්වැනිවර කියවා සභා සම්මත කරන ලදී.

6. රේගු ආඥාපනත යටතේ යෝජනා සම්මතය (අංක 1): අග්‍රාමාත්‍ය සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා ඉදිරිපත් කළ යෝජනාව,— රේගු ආඥා පනතේ (235 අධිකාරය) 10 වගන්තිය යටතේ ආනයන තීරු බදු සම්බන්ධයෙන් 2023.09.19 දින ඉදිරිපත් කරන ලද යෝජනා සම්මතය අනුමත කළ යුතු ය.

(2023 ජූනි 16 දිනැති අංක 2336/72 දරන අති විශේෂ ගැසට් පත්‍රය)

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

7. රේගු ආඥාපනත යටතේ යෝජනා සම්මතය (අංක 2): අග්‍රාමාත්‍ය සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා ඉදිරිපත් කළ යෝජනාව,— රේගු ආඥා පනතේ (235 අධිකාරය) 10 වගන්තිය යටතේ ආනයන තීරු බදු සම්බන්ධයෙන් 2023.09.19 දින ඉදිරිපත් කරන ලද යෝජනා සම්මතය අනුමත කළ යුතු ය.

(2023 ජූනි 30 දිනැති අංක 2338/54 දරන අති විශේෂ ගැසට් පත්‍රය)

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

8. රේගු ආඥාපනත යටතේ යෝජනා සම්මතය (අංක 3): අග්‍රාමාත්‍ය සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා ඉදිරිපත් කළ යෝජනාව,— රේගු ආඥා පනතේ (235 අධිකාරය) 10 වගන්තිය යටතේ ආනයන තීරු බදු සම්බන්ධයෙන් 2023.09.19 දින ඉදිරිපත් කරන ලද යෝජනා සම්මතය අනුමත කළ යුතු ය.

(2023 ජූලි 21 දිනැති අංක 2341/64 දරන අති විශේෂ ගැසට් පත්‍රය)

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

9. විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 1): අග්‍රාමාත්‍ය සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා ඉදිරිපත් කළ යෝජනාව,— 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 සහ 5 වගන්ති යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2023 මැයි 17 දිනැති අංක 2332/14 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2023.09.19 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

10. විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 2): අග්‍රාමාත්‍ය සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා ඉදිරිපත් කළ යෝජනාව,— 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 සහ 5 වගන්ති යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල්,

ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2023 මැයි 20 දිනැති අංක 2332/53 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2023.09.19 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

11. විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 3): අග්‍රාමාත්‍ය සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා ඉදිරිපත් කළ යෝජනාව,— 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 සහ 5 වගන්ති යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් වැඩ බලන මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2023 ජූනි 22 දිනැති අංක 2337/16 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2023.09.19 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

12. විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 4): අග්‍රාමාත්‍ය සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා ඉදිරිපත් කළ යෝජනාව,— 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2023 ජූලි 13 දිනැති අංක 2340/45 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2023.09.19 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

13. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ තීරණය: අග්‍රාමාත්‍ය සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා ඉදිරිපත් කළ යෝජනාව,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 153 වන ව්‍යවස්ථාවට අනුව, ජනාධිපතිවරයා විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ අනුමතියට යටත්ව විගණකාධිපතිවරයා පත් කරනු ලබන හෙයින් ද;

විගණකාධිපතිවරයාගේ වැටුප ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 153(2) ව්‍යවස්ථාව ප්‍රකාරව පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරනු ලබන අතර එය ඒකාබද්ධ අරමුදලට වැය බරක් වන හෙයින් ද;

ජනාධිපතිවරයා විසින් 2023 අගෝස්තු 28 දිනැතිව ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශය, 2023 සැප්තැම්බර් 04 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී සලකා බලා විගණකාධිපතිවරයාට විශ්‍රාම වැටුප් හිමිකම සහිත දීමනා පහත පරිදි ගෙවීමට අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලබා දී ඇති හෙයින් ද:—

(අ) විගණකාධිපතිවරයාට 2019.07.01 දින සිට 2022.12.31 දින දක්වා විශ්‍රාම වැටුප් හිමිකම සහිත රු. 25,000.00 ක මාසික දීමනාව ලබා දීමටත්; සහ

(ආ) එකී රු. 25,000.00 ක දීමනාව 2023.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි විශ්‍රාම වැටුප් හිමිකම සහිත රු. 50,000.00 ක දීමනාවක් දක්වා ඉහළ නැංවීමට.

ඊට අනුකූලව, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 153(2) ව්‍යවස්ථාව ප්‍රකාරව, විගණකාධිපතිවරයා වෙත රජයේ ඒකාබද්ධ අරමුදලට වැය බරක් වන පරිදි ඉහත සඳහන් විශ්‍රාම වැටුප් හිමිකම සහිත දීමනා ගෙවීම කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව නිශ්චය කරයි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

14. කල් තැබීම: ‘‘මෙම පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතු ය’’යි පාර්ලිමේන්තුවේ සභානායකවරයා විසින් යෝජනා කරන ලදී.

එකල්හි වේලාව අ.භා. 5.30 වූයෙන් නියෝජ්‍ය කථානායකවරයා විසින් ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.

පාර්ලිමේන්තුව ඊට අනුකූලව, 2023 ඔක්තෝබර් 05 බ්‍රහස්පතින්දා පූ.භා. 9.30 වනතෙක් කල් ගියේය.